

# කතෘගෙන්

1953 වර්ෂයේදී කළ තක්සේරුවක් අනුව, එවකට සැල්වීනියා ගහනයව තුබූ අක්කර 35,000ක්, 1960 වර්ෂය අවසානය වන විට මර්දනය සඳහා රුපියල් 80 ලක්ෂයක් වැය කරද්දී, අක්කර ගණනාව 50,000 තෙක් වැඩිවූවා මිස අඩුවක් නම් නොවීම ඇත්ත වශයෙන් සංවේග ජනක කරුණකි. සැල්වීනියා මර්දනය සඳහා මෙතෙක් රජය දරා ඇති වියදම හා උත්සාහය අති විශාල වූ නමුත් මෙසේ සැල්වීනියා ප්‍රමාණය වැඩිවීමට හේතු කීප යක් තිබේ. මෙම ව්‍යාපාරය පිළිබඳව මහජනයා පෙන්වා තිබෙන උනන්දුව මඳවීම, සැල්වීනියා මර්දනය සාර්ථක කිරීමට නොහැකිවූ කරුණකි. සාර්ථක සැල්වීනියා මර්දනය සඳහා රජය හා ගොවියා පමණක් වෙහෙසීමෙන් සතුටුදායක ප්‍රතිඵල ළඟා කර ගත නොහැක. සැල්වීනියා දිවයිනෙන් තුරන් කිරීමට නම් ප්‍රතිසංවිධානය කළ ව්‍යාපාරය කට ගොවියාගේ හා මෙරට මහජනයාගේ සහාය සහමුලින්ම ලබාගත යුතුව තිබෙන බව අපට පෙනේ.

ප්‍රතිසංවිධානය කළ සැල්වීනියා මර්දන ව්‍යාපාරයේ සැලැස්ම කෙරෙහි නෙත් යොමු කිරීමට පෙර, දිවයිනේ සැල්වීනියා මෙයාකාරව බෝවීමෙන් සිදුවී ඇති හානිය පිළිබඳ සිත් යොමු කරවිය යුතුය. දැනට සැල්වීනියා ගහනය වූ පහතරට වර්ෂා කලාපයේ ගංගා, ඇළ, දොළ, වැව්, පොකුණු හා වෙනත් පොදු ජල මාර්ග එසේ අවහිරවීමෙන් සමහර ස්ථානවල ඒවා සම්පූර්ණයෙන් ක්‍රියා විරහිතව තිබෙනවා බොහෝ අය දැක තිබෙනු නිසැකය. ගොවීන්ගේ කුඹුරු හා ඔවුන්ගේ වෙනත් පහත් බිම්වල සැල්වීනියා බෝවූ විට ඔව්හු ලබන්නේ දැරිය නොහැකි අලාභය. සැල්වීනියා වඳ කිරීමට විශාල මුදලක් හා වෙහෙසක් දැරිය යුතුව ඇති අතර, වගා කරන බෝගයෙන් පවා ලැබෙන්නේ බොහෝ සෙයින් හීන වූ අස්වැන්නකි. මෙම වල් පැළෑටියෙන් සමාජයට වන බලවත් අපරාධය මෙයින් පහසුව වටහා ගැනීමට පිළිවන.

1961 පෙබරවාරි පළමුවන දින සිට සැල්වීනියා මර්දනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පැවරීමෙන් පසු එම අංශයේ වැඩ ප්‍රතිසංවිධානය කරන ලදී. එතැන් සිට සැල්වීනියා මර්දනය සඳහා ආරම්භ කර ඇත්තේ සංශෝධනය කළ මර්දන වැඩ සටහනකි. ලංකා වේ සැල්වීනියා පැතිරී ඇති පිළිවෙළ අනුව, දිවයින සැල්වීනියා මර්දන කොට්ඨාශවලට



2**—ජේ. ඇන්. ආර්. 19405 (9/61)

බෙදූ ඒ අනුව දැනටම වැඩ කරගෙන යනු ලැබේ. සැල්වීනියා මර්දනය සාර්ථක කිරීම සඳහා ඉතා වැදගත් ලෙස සලකන කරුණ නම්, මර්දන වැඩ ගංගා ඉස්මත්තේ සිට ඒවා ගලායන දිය බැස්ම අනුව පහතට කරගෙන යෑමයි. දිය බැස්මේ පහතට එන්නේ උඩ කොටස්වල ඇති සැල්වීනියා සම්පූර්ණයෙන් විනාශ කිරීමෙන් පසුවය. මර්දන වැඩ මෙයාකාරව කළ විට සැල්වීනියා විනාශය සහමුලින්ම ඉටු කෙරෙයි. මින්පසු ඇති ඉතා වැදගත් කාර්යය නම්, සැල්වීනියා නැති කළ කොටස්වල නැවත බෝවීම වැළැක්වීමයි. එක් පැළෑටියක් හෝ ඉතිරිවීනම්, සුඩ කළ. කොට්ඨාශය සුළු කාලයකදී තුබූ තත්ත්වය ටම පමිණෙන නිසා මේ පිළිබඳව හැකිතරම් පරීක්ෂාකාරී විය යුතුය. ලංකාවේ සැල්වීනියා උවදුර මැඩලිය හැකි වන්නේ මෙවැනි පිරිසිදු වැඩ සටහනකින් පමණක් බව රජයට මනාව වැටහී තිබේ. මේ අතර නිසි වැඩ පිළිවෙළට විරුද්ධව තැනින් තැන සැල්වීනියා නාශක වැඩ නොකිරීමට මෙම නව අංශය තීරණය කර තිබේ.

සැල්වීනියා උවදුර පිළිබඳ විස්තර මහජනයා අතර පතල කිරීමේ වැඩ කටයුතු පවා මෙම කාර්යය ගොවිකම් දෙපාර්තමේන්තුව අතට ගත් පසු සියුම්ව හා ක්‍රමානුකූලව කර ගෙන යනු ලැබේ. පැළෑටිය පිළිබඳ විස්තර, එය බෝවන ක්‍රමය, ව්‍යාප්ති වන පිළිවෙළ සහ විනාශ කරන අන්දම පත්‍රිකා, සඟරා පමණක් නොව, ගුවන් විදුලිය මගින්ද ප්‍රචාරය කරනු ලැබේ. පැළෑටි සංරක්ෂණ ආඥාපනත යටතේ මෙම පැළෑටිය තහනම් කළ එකක් බව සහ එය වගාව හා ව්‍යාප්තිය දඬුවම් ලැබිය හැකි වරදක් බවද මහජනයා අතර පතුරුවා හැර තිබේ.

ගොවිකම් දෙපාර්තමේන්තුව අරමුණු කර ඇති පරිදි සැල්වීනියා මෙරටින් දෙවර්ෂයක දී සම්පූර්ණයෙන් තුරන් කළ හැකි වන්නේ ලාංකික ජනතාව සමූහ වශයෙන් එක්සිත්ව වැඩ කළොත් පමණය. රජය කෙතරම් වියදම් දැරුවත්, ගොවියා කෙතරම් වෙහෙසවුවත්, ලාංකික පොදු ජනතාවගේ උපකාරය නොමැතිව මෙම කාර්යය ඉටු කිරීම එතරම් පහසු නොවන බව අපට පෙනේ. දැනටද විශාල අවහිරකම් හා හිරිහැර උසුලා සිටින පහතරට වර්ෂා කලාපයේ ගොවියා සැල්වීනියා උවදුරෙන් මුදවාලීමට අප සියලු දෙන වෙහෙස වන්නේ නම් එයින් සිදුවන්නේ විශාල සේවයකි.